**11-12-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, මෙම සංගම යුගයෙදී ඔබ අයත් වන්නේ බ්‍රාහ්මන සමාජයටයි. ඔබ දැන් මරණීය දේශයේ මනුෂ්‍යයන්ගෙන්, අමරණීය දෙශයේ දේවතාවන් බවට පරිවර්ථනය විය යුතුයි.

**ප්‍රශ්නය:** ඔබට අසීමිත අත්හැරීමක් ඇති විය හැක්කේ, කුමන දැනුම වටහාගැනීමේ පදනම මතද?

**පිළිතුර:** ඔබට නාටකයේ නිවැරදි දැනුම තිබෙයි. නාටකයට අනුව, මුලු මරණීය දේශයම ගිණි ගත යුතු බව ඔබ දන්නවා. ලෝකය පැන්සයක්වත් නොවටී. අපි පවුමක් වටින අය බවට පත් විය යුතුයි. නාටකයේ කුමක් සිදුවුවද, එය ඒ ආකාරයෙන්ම චක්‍රයකට පසුව නැවතත් සිදු වීමට යනවා. මුලු ලෝකයම පිළිබඳව ඔබට අසීමිත අත්හැරීමක් තිබෙන්නේ මේ නිසාය.

**ගීතය:** හෙට දිනයේ වාසනාව ඔබයි.

ඕම් ශාන්ති. ඔය දරුවන් ගීතයේ පද පේළියකට සවන් දුන්නා. අමරණීය දේශය පැමිණෙන්නට යනවා. මෙය මරණීය දේශයයි. මරණීය දේශය සහ අමරණීය දේශය අතර ඇති ශ්‍රේෂ්ඨ සංගම යුගය මෙයයි. පරමාත්ම පියා දැන් අපට සංගම යුගයෙදී උගන්වයි. ඔහු උගන්වන්නේ ජීවාත්මයන්ටයි. එබැවින් ඔහු ඔය දරුවන්ට පවසන්නේ ජීවාත්ම අවධානයෙන් අසුන් ගන්න! අසීමිත පියා ඔබට උගන්වනවා, යන විශ්වාසය ඇති කරගන්න. අපගේ අරමුණ සහ ඉලක්කය වන්නේ, ලක්ෂ්මී සහ නාරායන වීමයි, මරණීය දේශයේ මනුෂ්‍යයන්ගෙන්, අමරණීය දේශයේ දේවතාවන් බවට පත් වීමයි. ඔබගේ දෙසවන් කිසිමදාක මෙවන් ඉගැන්වීම් අසා නොමැති අතර, කෙනෙක් දරුවන්ට ජීවාත්ම අවධානයෙන් අසුන් ගන්නට කියා කියනවා ඔබ කිසිදාක දැක නැතුව ඇති. අසීමිත පියා අපට උගන්වනවා, යන විශ්වාසය ඇති කර ගන්න. කුමන පියාද? ඒ අසීමිත පියාය ඒ අශාරීරික ශිවාය. අප සිටින්නේ උසස් සංගම යුගයේ බව ඔබට දැන් වැටහෙයි. ඔබ දැන් බ්‍රාහ්මන සමාජයේ කොටසක් බවට පත් වී ඇත. ඉන්පසුව ඔබ දේවතාවන් විය යුතුයි. පෙර ඔබ අයත් වූයේ ශුද්‍ර සමාජයටයි. පරමාත්ම පියා පැමිණ ඔබව ගල් වැනි බුද්ධි ඇති අයගෙන්, දිව්‍යමය බුද්ධි ඇති අය බවට පරිවර්ථනය කරයි. ඔබ මුලදී සතෝප්‍රධාන්, දිව්‍යමය බුද්ධි ඇති අයව සිටි අතර, දැන් නැවත වරක් එම අය බවට පත් වනවා. ඔබ ස්වර්ණමය යුගයේ අධිපතියන් යැයි ඔබ නොකිව යුතුයි. ස්වර්ණමය යුගයෙදී, ඔබ ලෝකයේ අධිපතියන් විය. උපත් 84ක් ගනිමින් සහ ඉනිමඟ දිගේ පහළට පැමිණෙන අතර, ඔබ සතෝප්‍රධාන් බවින්, සතෝ, රජෝ සහ තමෝ බවට පරිවර්ථනය විය. ආරම්භයේදී ඔබ සතෝප්‍රධාන්ව සිටි විට, ඔබගේ බුද්ධි, දිව්‍යමය විය. ඉන්පසුව ජීවාත්ම තුළට වෙනත් ලෝහ මිශ්‍ර විය. මනුෂ්‍යයන්ට මෙය නොවැටහෙයි. පරමාත්ම පියා පවසන්නේ ඔබ කිසිවක් දැන සිටියේ නැත ඔබට තිබුණේ අන්ධ විශ්වාසය පමණයි. ඔබ කෙනෙක්ව නොදැන, ඔහුව වන්දනා කරන්නේ හෝ සිහි කරන්නේ නම්, එයට අන්ධ විශ්වාසය යැයි කියයි. ඔබගේ උසස් ධර්මය සහ උසස් ක්‍රියා අමතක කිරීමෙන්, ඔබ කර්මයන්හී සහ ධර්මයෙහි දූෂිත විය. ඔවුන්ගේ දිව්‍යමය ධර්මයේ සිට, භාරතයේ ජනයා, දූෂිත වී ඇත. එම දේවතාවන් අපවිත්‍ර වූ විට, ඔවුන්ට තව දුරටත් දේවතාවන් යැයි කිව නොහැක. ඔවුන්ගේ නම වෙනස් කර, තමන්ව හින්දූන් යැයි හැඳින්වූයේ ඒ නිසාය. මෙයද නාටකයේ සැලසුමට අනුව සිදුවෙයි. සෑම කෙනෙක්ම කන්නලව් කරන්නේ ඒකායන පියාටයි අහෝ පාරිශුද්ධකරුවාණෙනි වඩිනු මැනව! පුනර්භවයෙන් මිදී සිටින එකම දෙවි පියාණන් ඔහු පමණයි. නමක් හෝ රූපයක් නැති කිසිවක් නොමැත. ජීවාත්මය සහ උත්තරීතර ජීවාත්මයේ ස්වරූපය, ඉතාමත්ම සූක්ෂමයි. ජීවාත්මයකට තරුවක් මෙන්ම තිතක් යැයිද කියයි. ශිවාට වන්දනා කරන නමුත් ඔහුට සිරුරක් නැත, නමුත් ජීවාත්මයකට, එනම් තිතකට වන්දනා කළ නොහැක. එබැවින්, ඔහුට වන්දනා කිරීම සඳහා ඔවුන් එහි විශාල පිළිරුවක් සාදයි. ඔවුන් ශිවාව වන්දනා කරන බව විශ්වාස කරන නමුත්, ඔවුන් ඔහුගේ නම හෝ ස්වරූපය නොදනී. මේ සියලුම කාරණා පරම පියා පැමිණ විස්තර කරන්නේ දැන් පමණයි. පියා පවසන්නේ ඔබ ඔබගේම උපත් ගැන නොදනී. ඔවුන් සත්ව වර්ග මිලියන 8.4ක් ගැන පවසා ඇත්තේ මුසාවකි. පරමාත්ම පියා දැන් අසුන්ගෙන ඔය දරුවන්ට විස්තර කර දෙයි. ඔබ දැන් බ්‍රාහ්මනයින් බවට පත්ව ඇති අතර දේවතාවන් වීමට සිටිනවා. කලි යුගයේ මිනිසුන් ශුද්‍රයින්ය. ඔය බ්‍රාහ්මනයින්ගේ අරමුණ සහ ඉලක්කය වන්නේ, සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන් දේවතාවන් වීමයි. මෙම මරණීය දේශය, අපවිත්‍ර ලෝකයකි. එය, දේවතාවන් පාලනය කළ, නව ලෝකය විය. එවිට තිබුණේ ඔවුන්ගේ රාජධානිය පමණයි. ඔවුන් මුලු ලෝකයේම අධිපතියන් විය.

ලෝකය දැන් තමෝප්‍රධාන්ය. බොහෝ ආගම් තිබේ. දේවතා ධර්මය අතුරුදහන්ව ඇත. දේවතාවන් කවදා, කෙතරම් කාලයක්, පාලනය කළාද, යන ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය පිළිබඳව කිසි කෙනෙක් නොදනී. පැමිණ ඔබට මෙය විස්තර කර දෙන්නේ පරමාත්ම පියා පමණයි. මෙය දෙව් පියාණන්ගේ විශ්ව විද්‍යාලය වන අතර, එහි අරමුණ සහ ඉලක්කය වන්නේ ඔබව අමරණීය දේශයේ දේවතාවන් බවට පත් කරවීමය. මෙය අමරණීයත්වයේ කතා පුවත නමින්ද හැඳින්වෙයි. ඔබ මෙම ඥානය තුළින් දේවතාවන් වී, මරණය පරාජය කරයි. එහිදී මරණය ඔබව කිසිදාක ගිල දමන්නේ නැත එහි මරණය පිළිබඳ සඳහනක් නැත. නාටකයේ සැලසුමට අනුව, ඔබ මරණය පරාජය කරනවා. භාරතයේ ජනයා, වසර පහේ සහ දහයේ සැලසුම් සාදයි. ඔවුන් රාම රාජ්‍යය ස්ථාපිත කරන බවද විශ්වාස කරයි. රාම රාජ්‍යය නිර්මාණය කිරීමට, අසීමිත පියාට ද සැලැස්මක් තිබේ. ඔවුන් සියලු දෙනාම මනුෂ්‍යයන්ය. මනුෂ්‍යයන්ට රාම රාජ්‍යය ස්ථාපිත කළ නොහැක. ස්වර්ණමය යුගය, රාම රාජ්‍යය ලෙස හැඳින්වෙයි. කිසිම කෙනෙක් මෙම දේවල් ගැන නොදනී. මනුෂ්‍යයන් බොහෝ භක්තියේ යෙදෙන අතර, භෞතික වන්දනා ගමන් වලද යයි. දිවා කල යනු, ස්වර්ණමය සහ රිදී යුගවලදී, එය දේවතාවන්ගේ රාජධානිය වන විටයි. භක්ති මාර්ගය ආරම්භ වන්නේ රාත්‍රියේය. ස්වර්ණමය යුගයේ භක්තිය නොමැත. පරමාත්ම පියා, ඥානය, භක්තිය සහ නිරාශාව පිළිබඳව විස්තර කරයි. නිරාශාවේ වර්ග දෙකකි. එකක් හුදකලා මාවතේ, හත යෝගීන්ගේ එකයි, ඔවුන් සිය නිවෙස් අතහැර වනගත වෙයි. ඔබට දැන් මුලු මරණ දේශය පිළිබඳවම අසීමිත අතහැරීමක් තිබිය යුතුයි. පරම පියා පවසන්නේ මේ මුලු ලෝකයම සම්පූර්ණයෙන්ම ගිණිබත් වීමටයි යන්නේ. ඔබ නාටකය ඉතා හොඳින් වටහා ගත යුතුයි. එය අඛණ්ඩව උකුණෙක් මෙන් ගෙවී යයි. දැන් සිදුවන සෑම දෙයක්ම, ඒ අන්දමින්ම, වසර 5000ක චක්‍රයකට පසුව නැවතත් සිදු වීමට යනවා. ඔබ මෙය හොඳින් තේරුම් ගෙන, අසීමිත අතහැරීමක් තිබිය යුතුයි. නිදසුනක් ලෙස, කෙනෙක් විදේශ ගත වූ විට, ඔහු විමසන්නේ ‘මට මෙම ඥානය එහිදී හැදෑරිය හැකිද?’ පියා පිළිතුරු දෙන්නේ ඔබ කොහේ අසුන් ගෙන සිටියත් ඔබට මෙම ඥානය හැදෑරිය හැක. මේ සඳහා පළමුවෙන්ම ඔබ දින හතේ පාඨමාලාව ගත යුතුයි. මේ සියලු කාරණා වටහාගැනීම, ජීවාත්මයකට ඉතා පහසුයි. ඔබ සතෝප්‍රධාන් ලෝකයේ අධිපතියන් වූ කල, ඔබ සතෝප්‍රධාන් විය. ඔබ දැන් තමෝප්‍රධාන් වී තිබේ. උපත් 84ක් ගැනීමෙන් පසු, ඔබ සම්පූර්ණයෙන්ම පැන්සයක්වත් නොවටිනා අය බවට පත්ව තිබේ. ඔබ පවුමක් වටින අය වන්නේ කෙසේද? එය දැන් කලි යුගය වන අතර, ඉන්පසුව එය නිසැකයෙන්ම ස්වර්ණමය යුගය වෙයි. පියා බොහෝ සරළ අන්දමින් විස්තර කරයි. ඔබ දින හතේ පාඨමාලාව වටහාගත යුතුයි ඔබ සතෝප්‍රධාන් බවින් තමෝප්‍රධාන් වූයේ කෙසේද කියා. ඔබ තමෝප්‍රධාන් වූයේ, රාගයේ කොත මත අසුන් ගැනීමෙනි. ඔබ දැන් ඥානයෙහි කොත මත අසුන්ගෙන, සතෝප්‍රධාන් විය යුතුයි. ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය අඛණ්ඩව නැවත නැවතත් සිදු වන අතර, චක්‍රය නොකඩවා භ්‍රමණය වෙයි. එය දැන් සංගම යුගය වන අතර, ඉන්පසුව එය ස්වර්ණමය යුගය වෙයි. ඔබ දැන් කලි යුගයේ දූෂිත වී ඇත. එබැවින් ඔබ ස්වර්ණමය යුගයේදී මෙන් දුර්ගුණ වලින් තොර වන්නේ කෙසේද? මෙය කරන අන්දම, පරමාත්ම පියා පෙන්වා දෙයි. ඔවුන් කන්නලව් කරන්නේ අපට ගුණදම් නැත, අපව ගුණදම් වලින් පුරවන්න! චක්‍රයකට පෙර, මෙය වූ අය පමණයි, නැවතත් මෙය බවට පත්වෙන්නේ. පරම පියා විස්තර කරන්නේ පළමුවෙන්ම තමා ජීවාත්මයක් බව සලකන්න! ජීවාත්මයක් එක් සිරුරක් අත්හැර, තවෙකක් ගනී. ඔබ දැන් ජීවාත්ම අවධානයට පත් විය යුතුයි. ඔබ ජීවාත්ම අවධානයට පත් විය යුත්තේ කෙසේද, යන ඥානය ඔබට ලැබෙන්නේ දැන්ය. ඔබට නිරන්තරයෙන් ජීවාත්ම අවධානයෙන් සිටිය නොහැක. ස්වර්ණමය යුගයේදී, ඔබගේ සිරුරු වලට නම් තිබෙයි. ලක්ෂ්මි සහ නාරායනගේ සියලුම ක්‍රියාකාරකම් ඔවුන් සිදුකරන්නේ ඔවුන්ගේ නම් මාර්ගයෙනි. මෙය දැන් පරමාත්ම පියා විස්තර කර දෙන, සංගම යුගයයි. ඔබ පැමිණියේ අශාරීරිකව වන අතර, ඔබ ආපසු යා යුත්තේද අශාරීරිකවයි. තමන් ජීවාත්මයක් බව සලකා, පරමාත්ම පියාව සිහිකරන්න! ආධ්‍යාත්මික වන්දනා ගමන මෙයයි. ජීවාත්මය, ඔහුගේ ආධ්‍යාත්මික පියාව සිහිපත් කරයි. ඔබගේ පාපයන් පිළිස්සී යන්නේ, පරම පියා සිහිපත් කිරීමෙන් පමණයි. මෙයට යෝගාවේ ගින්න යැයි කියයි. ඔබට ඕනෑම ස්ථානයක සිට ඔහුව සිහි කළ හැක. චක්‍රය භ්‍රමණය වන ආකාරය සහ අපි ඉනිමඟ දිගේ පහළට පැමිණි ආකාරය ගැන ඔබ දින හතකදී විස්තර කළ යුතුයි. ඉහළ නැඟීමේ තත්ත්වය තිබෙන්නේ මෙම එක් උපතේදී පමණයි. එහි ජීවත් වන දරුවන් සඳහා, මුරලි විදෙස් රටවලටද යැවෙයි. මෙය පාසැලක්. ඇත්ත වශයෙන්ම මෙය දෙව් පියාණන්ගේ විශ්ව විද්‍යාලයක්. ගීතාවේ සඳහන් කර ඇති, රාජයෝගාව මෙයයි. කෙසේවෙතත් බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර්ද දේවතාවන් බැවින්, ශ්‍රී ක්‍රිෂ්ණා දෙවියන් විය නොහැක. ඔබ දැන් නැවතත් දේවතාවන් වීමට උත්සාහ දරමින් සිටිනවා. ප්‍රජාපිතා බ්‍රහ්මද අනිවාර්යයෙන්ම මෙහි සිටියි ප්‍රජාවගේ පියා, මනුෂ්‍යයෙකි. මනුෂ්‍යයින් සැබවින්ම නිර්මාණය වන්නේ, මෙහිදීය. පරමාත්ම පියා, ‘හම් සෝ’හි අරුත පිළිබඳ ඉතා පහසු පැහැදිලි කිරීමක් ලබා දී ඇත. භක්ති

මාර්ගයේදී ඔවුන් පවසන්නේ, ජීවාත්මයක්, උත්තරීතර ජීවාත්මය බවයි. දෙවියන්, සර්ව ව්‍යාප්තික බව ඔවුන් පවසන්නේ, ඒ නිසාය. පරම පියා පවසන්නේ සෑම කෙනෙක් තුළම පෙනී සිටින්නේ ජීවාත්මයකි. මා කෙසේද සෑම කෙනෙක් තුළම පෙනී සිටින්නේ? ඔබ මට කන්නලව් කරන්නේ අහෝ පාරිශුද්ධකරුවාණෙනි, පැමිණ අපව පිවිතුරු කරන්න! අශාරීරික ජීවාත්ම පැමිණ, ඔවුන්ගේම රථ ගනී. සියලුම අමරණීය ජීවාත්මයන්ගේ සිංහාසන ඒවාය. එය සිහසුනක් හෝ රථයක් ලෙස ඔබට හැඳින්විය හැක. පරමාත්ම පියාට ඔහුගේම රථයක් නොමැත. ඔහුව සිහි කෙරෙන්නේ අශාරීරික ලෙසින්ය. ඔහුට ශාරීරික සිරුරක් හෝ සූක්ෂම සිරුරක් නැත. අශාරීරික කෙනා, රථයක් තුළ අසුන් ගත් විට පමණයි ඔහුට කතා කළ හැක්කේ. රථයක් නොමැතිව, ඔහු අපවිත්‍ර අයව පිවිතුරු කරන්නේ කෙසේද? පියා පවසන්නේ අශාරීරික කෙනා වන මා, පැමිණ මෙය ණයට ගන්නවා. එය තාවකාලික ණයකි. ඔහුට ‘භාග්‍ය රථය’ යැයි කියයි. ලෝකයේ මුල, මැද සහ අවසානය පිළිබඳ රහස් විස්තර කර දීමෙන්, පරමාත්ම පියා ඔය දරුවන්ව, ත්‍රිකාලදර්ශී කරවයි. වෙනත් කිසිම මනුෂ්‍යයෙකුට මෙම ඥානය දැනගත නොහැක. වර්තමානයේ සෑම කෙනෙක්ම අදේවවාදීන්ය. පරම පියා පැමිණ, ඔබව දේවවාදීන් බවට පත්කරවයි. ඔහු ඔබට නිර්මාණකරු සහ නිර්මාණය පිළිබඳ රහස් කියා ඇත. ඔබ හැර වෙනත් කිසිවෙකුට මෙය විස්තර කළ නොහැක. මෙම ඥාන මාර්ගයෙන් ඔබ බොහෝ උසස් තත්ත්වයක් හිමි කරගනී. ඔය බ්‍රහ්මනයින්ට මෙම ඥානය ලැබෙන්නේ මේ කාලයේදී පමණයි. පරමාත්ම පියා දැන්, සංගම යුගයෙදී පැමිණෙන්නේ, මෙම ඥානය ලබා දීමටයි. විමුක්තිය පිරිනමන එකම කෙනා, පරමාත්ම පියා පමණයි. කිසිම මනුෂ්‍යයෙකුට තවත් කෙනෙකුට විමුක්තිය පිරිනැමිය නොහැක. ඒ සියලුම ගුරුන් අයත් වන්නේ භක්ති මාර්ගයටයි. සත්ගුරු වන්නේ ඒකායන ඔහුම පමණයි. ඔහු ගැනයි පැවසෙන්නේ, ‘වාහ් සත්ගුරු! වාහ්!’ මෙයට පාසැලක් කියා කියයි. අරමුණ සහ ඉලක්කය වන්නේ, සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන් නාරායන වීමයි. ඒ සියලුම කතාපුවත් අයත් වන්නේ භක්ති මාර්ගයටයි. ගීතාව තුළින් කිසිම ලැබීමක් නැත. පරම පියා පවසන්නේ මා ඔය දරුවන්ට පෞද්ගලිකවම ඉගැන්වීමට පැමිණෙන්නෙමි. ඔබට එම තත්ත්වය හිමි වන්නේ මෙය තුළිනි. මෙහි ප්‍රධානතම කාරණය වන්නේ, පාරිශුද්ධ වීමයි. ඔබ පරම පියා සිහි කළ යුතුයි. මායා බාධක ඇති කරන්නේ මෙහිය. ඔබ පියා සිහි කරන්නේ ඔබගේ උරුමය හිමි කර ගැනීමටයි. මෙම ඥානය, සියලුම දරුවන්ට යවනවා. එකදු මුරලියක්වත් කිසිමදාක අතපසු නොකළ යුතුයි. මුරලියක් අතපසු වීම යනු, නොපැමිණීමේ ලකුණක් ලැබීමයි. ඔබ කොහේ සිටියත් ඔබට මුරලියකින් නැවුම් විය හැක. ඔබ ශ්‍රීමත් අනුගමනය කළ යුතුයි. පරමාත්ම පියා විස්තර කරන්නේ ඔබ විදේශයකට ගිය විටදීද ඔබ අනිවාර්යෙන්ම පාරිශුද්ධව සිටිය යුතුයි! ඔබ වයිශ්නවයෙක් විය යුතුයි. වයිශ්නවයන් දෙකොටසකි, සැබෑ වයිශ්නවයන් සහ පාපයේ ගැලෙන වල්ලභචාරීන් ඔවුන් පිවිතුරු නැත. ඔබ පිවිතුරු වන අතර, විෂ්ණු රජ පෙළපතේ කොටසක් බවටද පත්වෙයි. ඔබ එහිදී වයිශ්නවයන් ලෙස රැඳී සිටියි ඔබ පාපයේ නොගැලෙයි. එය අමරණීය දේශයයි. මෙය, මිනිසුන් පාපයේ ගැලෙන මරණීය දේශයයි. ඔබ දැන් පාපයන් නොමැති විෂ්ණුගේ දේශයට යනවා. එය පාපයන් නොමැති ලෝකයයි. ඔබ, ඔබගේ යෝගා බලයෙන් ලෝක ආධිපත්‍යය හිමි කරගන්නවා. එම දෙපිරිස එකිනෙකා සමග සටන් කරන අතර, ඔබ ඒ අතරින් වෙඬරු පිඩ ලබාගනී. ඔබ ඔබගේම රාජධානිය ස්ථාපිත කරනවා. සෑම කෙනෙකුටම මෙම පණිවිඩය දෙන්න. කුඩා දරුවන්ටද මෙයට සවන් දීමට අයිතියක් ඇත. ඔවුන් ශිව බාබාගේ දරුවන්ය, එබැවින් ඔවුන් සියල්ලන්ට ඒ සඳහා අයිතියක් ඇත. සෑම කෙනෙකුටම පවසන්න තමන් ජීවාත්මයක් බව සලකන්න! මවකට සහ පියෙකුට මෙම ඥානය තිබෙන විට, ඔවුන් තම දරුවන්ටත්, ශිව බාබාව සිහි කිරීමට කියා දෙයි. ශිව බාබා හැර වෙනත් කිසිවෙකු සිහි නොකළ යුතුයි. ඒකායන කෙනාගේ සිහිපත් කිරීම තුළින්, ඔබ තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වෙයි. මේ සඳහා ඔබ ඉතා හොඳින් ඉගෙනගත යුතුයි. ඔබට විදේශයක සිටත් මෙය හැදෑරිය හැක. මේ සඳහා ඔබට පොත් අවශ්‍ය නැත. ඔබට ඕනෑම තැනක අසුන්ගෙන මෙය ඉගෙනගත හැක. ඔබට ඔබගේ බුද්ධියෙන් සිහිපත් කිරීමේ සිටිය හැක. මෙම ඉගෙනුම ඉතාමත්ම පහසුයි. ඔබට යෝගාව, සිහිපත් කිරීම, තුළින් බලය ලැබෙයි. ඔබ දැන් ලෝකයේ අධිපතියන් බවට පත් වනවා. පරමාත්ම පියා ඔබට රාජයෝගාව ඉගැන්වීමෙන් ඔබව පාරිශුද්ධ කරයි. එය, හත යෝගාවයි මෙය රාජ යෝගාවයි. මෙහිදි ඔබ බොහෝ ආරක්ෂක පියවර ගත යුතුයි. ඔබ ලකෂ්මි සහ නාරායන මෙන් සියලුම ගුණධර්ම වලින් පිරි සිටිය යුතයි. ඔබ ආහාර පාන ගැනීමේදී ආරකෂා විය යුතුයි. ඔබගේ බොහෝ උපත් වල පාපයන් කැපී යාමට හැකි වන සේ, ඔබ පරම පියාගේ සිහිපත් කිරීමේද සිටිය යුතුයි. මෙය හැඳින්වෙන්නේ රාජධානිය හිමි කරගැනීම සඳහා තිබෙන පහසු රාජයෝගාව කියාය. ඔබ රාජධානිය හිමි කර නොගන්නේ නම්, ඔබ දුගී වෙයි. ඔබ සම්පූර්ණයෙන්ම ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් උසස් වෙයි. ඔබ පහත් බවින් උසස් විය යුතුයි. මේ සඳහා, ඔබ පරමාත්ම පියා සිහිපත් කළ යුතුයි. ඔබ පෙර චක්‍රයේද මෙම ඥානය ලබාගත් අය වන අතර, ඔබට දැන් එය නැවතත් ලැබෙනවා. ස්වර්ණමය යුගයේ වෙනත්

රාජධානියක් නැත. එයට සතුටේ දේශය යැයි කියයි. මෙය දැන් ශෝකයේ දේශය වන අතර, ජීවාත්ම වන අප පැමිණෙන ස්ථානය, සාම දේශයයි. මනුෂ්‍යයින් මේ ලෝකයේ සිදු කරන ක්‍රියා පිළිබඳව ශිව බාබා විශ්මයට පත්වනවා! අඩු දරු උපත් සංඛ්‍යාවක් ඇති කිරීමට මිනිසුන් බොහෝ සේ වෙහෙස වෙයි. එම කාර්යය, පරම පියාගේ කාර්යය පමණක් බව, ඔවුන්ට නොවැටහෙයි. පියා සැනෙකින් එක් ධර්මය ස්ථාපිත කර, අන් සියල්ලන්ගේ විනාශය දිරිමත් කරයි. ඒ මිනිසුන් උපත් පාලනය සඳහා බොහෝ නව ඖෂධ නිපදවයි. පරමාත්ම පියාට තිබෙන්නේ එක් බෙහෙතක් පමණයි. එක් ධර්මය ස්ථාපිත කළ යුතුයි. ඔබ සෑම කෙනෙක්ම පිවිතුරු වී ඇති බව පවසන, කාලයක් පැමිණෙයි. එවිට කිසිම ඖෂධයකට අවශ්‍යතාවයක් නොතිබෙනු ඇත. එය තුළින් ඔබ උපත් 21කට පිවිතුරු වන, ‘මන්මනභව’ යන ඖෂධය, පරමාත්ම පියා ඔබට ලබා දී තිබේ. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පාරිශුද්ධව රැඳී සිටීමෙන්, සැබෑ වයිශ්නවයෙකු වන්න. ඔබගේ ආහාර පාන පිළිබඳව සම්පූර්ණයෙන් ප්‍රවේසම් වන්න. උසස් වීම සඳහා, ඔබ අනිවාර්යෙන්ම ශ්‍රීමත් අනුගමනය කළ යුතුයි.
2. මුරලියකින් ඔබව නැවුම් කරගන්න. ඔබ කොහේ ජීවත් වුණත්, සතෝප්‍රධාන් වීමට උත්සාහ දරන්න. ඔබ දවසකටවත් මුරලියක් අතපසු නොකළ යුතුයි.

**වරදානය:** ලෝක ප්‍රතිලාභය සඳහා ඔබ කරන සේවයේ දී, ඔබටම ප්‍රතිලාභ ලබා ගැනීමෙන්, ප්‍රායෝගික උදාහරණයක් ලෙස සාර්ථකත්වයේ ප්‍රතිමූර්තියක් බවට පත් වේවා.

වර්තමානයේ, සියලුම රෝග පාහේ හෘදයාබාධ නිසා ඇතිවේ. එලෙසම, අධ්‍යාත්මික දියුණුව සම්බන්ධයෙන් ගත් කල, මිනිසුන් අධෛර්යයට පත්වීමේ රෝග වැඩිය. අධෛර්යයට පත් ජීවාත්මයක ප්‍රායෝගික පරිවර්තනයක් දැකීමෙන්, මිනිසුන් ධෛර්යය සහ බලය වර්ධනය කරයි. ඔවුන් බොහෝ දේ අසා ඇති අතර දැන් යමක් දැකීමට කැමතියි. ආදර්ශයක් දැකීමෙන් ඔවුන් තුළ පරිවර්තනයක් ඇති කිරීමට ඔවුන්ට අවශ්‍යයි. එබැවින්, ලෝක ප්‍රතිලාභය සඳහා, පළමුවෙන්ම ඔබ ඔබටම ප්‍රතිලාභ ලබා ගැනීමේ නියැදිය ඔවුන්ට පෙන්වන්න. ලෝක ප්‍රතිලාභය සඳහා ඔබ කරන සේවයේදී සාර්ථකත්වයේ ප්‍රතිමූර්තියක් වීමට මාර්ගය වන්නේ ප්‍රායෝගික උදාහරණයක් වීමයි. පරමාත්ම පියාගේ හෙළිදරව්ව සිදුවන්නේ මේ හරහා පමණි. ඔබ කතා කරන දේවල් ඔබේ ප්‍රායෝගික ස්වරූපයෙන් දකින විට පමණක් ඔවුන් සියල්ල පිළිගන්නවා.

**පාඨය:** ඔබේ අදහස් අන් අයගේ අදහස් සමඟ ගැලපීම යනු ගෞරවය දැක්වීමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ වීමට සහ කර්මතීත් වීමට ගැඹුරු සැලකිල්ලක් දක්වන්න.**

කර්මතීත් වීමට නම්, ඔබ ඔබේ ක්‍රියාවන්හි බන්ධනයෙන් කොතරම් දුරට නොබැඳිව ඇත්දැයි පරීක්ෂා කරන්න. ඔබේ ලෝකික සහ ආලෝකික සම්බන්ධයෙන් සහ ක්‍රියා සහ සබඳතා වලදී ඔබ ආත්මාර්ථකාමී චේතනා වලින් කොතරම් දුරට නිදහස් වී තිබේද? ඔබ කර්ම ගිණුම් වල බලපෑමෙන් සහ ඕනෑම නාස්තිකාර ස්වභාවයකින් හෝ සංස්කාර වලින් නිදහස් වූ විට, කර්මතීත් අවධියට ළඟා වීමට හැකි වනු ඇත. කිසිදු ආකාරයක සේවාවක්, රැස්වීමක් හෝ අහිතකර තත්වයක් ඔබේ මුල්, උසස් අවධියේ උච්චාවචනය වීමට හේතු නොවිය යුතුය. මෙම බන්ධනයෙන් පවා නිදහස් වීම යනු කර්මතීත් අවධියට සමීප වීමයි.